# සිංහල ඩිප්ලෝමා පාඨමාලාව - 2024/2025
# සිංහල අධ්‍යයනාංශය - කොළඹ විශ්වවිද්‍යාලය

## 01. හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය මගින් මෙම ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ගේ සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය සම්බන්ධ දැනුම හා කුසලතා අභිවර්ධනය කිරීමේ අභිප්‍රායෙනි.

## 02. මාධ්‍යය - සිංහල

## 03. පාඨමාලා ව්‍යුහය

සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය පිළිබඳ පාඨමාලා ඒකක 05 කින් සහ විචාරාත්මක නිබන්ධයකින් (වචන 4000) සමන්විත වේ.

DPS 001 - පුරාතන සිංහල සාහිත්‍යය
DPS 002 - සාහිත්‍ය ප්‍රවේශය
DPS 003 - නිර්මාණාත්මක ලේඛනය
DPS 004 - භාෂාව හා රචනය
DPS 005 - සිංහල සංස්කෘතිය
DPS 006 - විචාරාත්මක නිබන්ධය

## 04. ඉලක්ක කණ්ඩායම

මෙම පාඨමාලාව ප්‍රමුඛ වශයෙන් ම ගුරුවරුන්, කළමනාකාර සහකාර වෘත්තිකයන්, ජනමාධ්‍යවේදීන්, නිර්මාණකරුවන් වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ට මෙන් ම සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය විධිමත්ව හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට බෙහෙවින් වැදගත් වනු ඇත.

## 05. සුදුසුකම්

1. අ.පො.ස (උ/පෙ) විෂයන් තුනකින් සමත්වීම (ඕනෑම විෂය ධාරාවකින්)

**හෝ**

2. ඉහත සුදුසුකම් හා සමාන යැයි කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම හා වසර දෙකක (02) සේවා පළපුරුද්ද

(සියලු අයදුම්කරුවන් සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයක් /සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.)

## 06. කාලය

එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවකි. (සෙනසුරාදා දිනවල පෙ.ව 9.00 - ප.ව 12.00 දක්වා දේශන පැවැත්වේ) දේශන සඳහා පැය 160 කි. කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ දී දේශන පැවැත්වේ.

## 07. ඇගයීම් ක්‍රමවේදය

පාඨමාලා ඒකකයක ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 75% ක් හා පැවරුම සඳහා ලකුණු 25% ක් බැගින් ලකුණු 100% ක් හිමි වේ. විචාරාත්මක නිබන්ධය සඳහා ලකුණු 100කි. සමත්වීම සඳහා සෑම පාඨමාලා ඒකකයකින් ම අවම වශයෙන් ලකුණු 50ක් ලබා ගත යුතුය. ඉහළ ලකුණු ලබා ගන්නා අපේක්ෂයන්ට විශිෂ්ට/සම්මාන සාමර්ථ්‍ය හිමි වනු ඇත.

## 08. දේශක මණ්ඩලය

සිංහල අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය විසින් දේශන පවත්වනු ලැබේ.

### 1. පාඨමාලා ගාස්තු

| | |
|---|---|
| අයදුම්පත් ගාස්තුව | රු 1,000.00 |
| ලියාපදිංචි ගාස්තුව | රු 2,000.00 |
| පාඨමාලා ගාස්තුව | රු 52,000.00 |
| විභාග ගාස්තුව | රු 5,000.00 |
| **එකතුව** | **රු 60,000.00** |

### 2. අයදුම් කිරීම

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රකාශන අංශයෙන් හෝ සිංහලාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත් අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් සමග පහත ලිපිනයට එවිය යුතුය. **මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැරවන සේ යොමු අංක 304013100002 ට රු. 1000.00 ගෙවා එම ලදු පත හා අයදුම්පත්‍රය 2024/12/10 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.**

**සිංහල ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025**
අධ්‍යයන හා ප්‍රකාශන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය
අංක 94
කුමාරතුංග මුනිදාස මාවත
කොළඹ 03

විමසීම් - 0112-500453